## විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2024.03.05
## පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)

2024 වර්ෂයේ I කාර්තුවෙහි I වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2024.03.05 දින නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) කාර්යාලයේ දී පැවැත් වූ අතර එහි රැස්වීම් වාර්තාව පහත පරිදි ඉදිරිපත් කරමි.

2024.03.05 වන දින ප.ව.2.00 ට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) කේ.ආර්.අබේසිරිවර්ධන මයාගේ ප්‍රධානත්වයෙන් පැවත්වූ අතර එදින පැමිණ සිටි සියළු නිලධාරීන් පිළිගෙන රැස්වීමේ කටයුතු ආරම්භ කෙරුණි.

<u>සහභාගී වූ නිලධාරීන්</u>

01. කේ.ආර්.අබේසිරිවර්ධන මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
02. ආර්.පී.හෙට්ටිආරච්චි මයා - ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති - ජාතික විගණන කාර්යාලය
03. ආර්.පී.ගුණවර්ධන මිය - අධ්‍යක්ෂ (ගොඩනැගිලි) - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
04. ටී.කේ.ආර්.දිලේශිකා මිය - ප්‍රධාන ගණකාධිකාරී - පළාත් ඉංජිනේරු කර්යාලය (බ.ප.)
05. එම්.කේ.සුගත් ද සිල්වා මයා - විගණන අධිකාරී - ජාතික විගණන කාර්යාලය
06. ඩී.ඩී.චන්ද්‍රානි සේනවිරත්න මිය - අභ්‍යන්තර විගණක - අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව (බ.ප.)
07. පී.එල්.ඩී.ඒ.එස්.පනාගොඩ මිය - අධ්‍යක්ෂ ඉංජිනේරු - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
08. එල්.එම්.ඩී.ආර්.ද මෙල් මිය - ගණකාධිකාරී - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
09. ජී.ඩී.විපුලසේන මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - බත්තරමුල්ල.
10. ඒ.කේ.රුවන් අලවත්ත මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - මීගමුව.
11. එල්.බී.සම්පත් පෙරේරා මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - හොරණ.
12. එස්.ඩී.සේනාරත්න මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - පානදුර.
13. පී.ආර්.මධුරංග මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - මිනුවන්ගොඩ.
14. එල්.ඩී.ගලබඩ මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - ගම්පහ.
15. ඒ.ඒ.ද සොයිසා මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - හෝමාගම.
16. අයි. කොටඹගේ මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - බියගම.
17. ඩබ්.පී.ආර්.වේලාතන්ත්‍රි මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - මතුගම.
18. එච්.එස්.චන්දන මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - වත්තල.
19. ඩී.සී.එන්.කලන්සූරිය මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - කළුතර.
20. ආර්.ඩබ්.සී.ගුණවර්ධන මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - රත්මලාන.
21. පී.ඩී,ආර්.නදීරා මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - කොළඹ.
22. කේ.කේ.පී.රණතුංග මිය - පරිපාලන නිලධාරි - පළාත් ඉංජිනේරු කාර්යාංශය
23. ඩබ්.අයි.නිලාන්ති මෙය - මුදල් සහකාර - පළාත් ඉංජිනේරු කාර්යාංශය
24. එල්.එස්.පී.පෙරේරා මිය - කළමනාකරණ සේවා නිලධාරි - පළාත් ඉංජිනේරු කාර්යාංශය
25. ඩබ්.එන්.සී.කුරේ මිය - කළමනාකරණ සේවා නිලධාරි පළාත් ඉංජිනේරු කාර්යාංශය
26. ඩබ්.කේ.එම්.ඩී.එන්.කුලසේකර මෙය - කළමනාකරණ සේවා නිලධාරි පළාත් ඉංජිනේරු කාර්යාංශය
27. ඒ.එල්.එම්.පෙරේරා මිය - කළමනාකරණ සේවා නිලධාරි - පළාත් ඉංජිනේරු කාර්යාංශය

## 01. පසුගිය විගණන කමිටු වාර්තාවේ ප්‍රගතිය සාකච්ඡා කිරීම

<table>
<tr><th></th><th>කාරණය</th><th>සාකච්ඡා වූ කරුණු/ තීරණ</th><th>වගකීම</th></tr>
<tr><td>01</td><td>මාසික බැංකු සැසඳුම්</td><td>මේ වන විට සියළුම කාර්යාල විසින් බැංකු සැසඳුම් මෘදු පිටපත නියමිත දින වන විට අභ්‍යන්තර විගණන කාර්යාලයට එවා ඇති බවත් ඒ ආකාරයෙන්ම දිගටම කරගෙන යන ලෙසත් අභ්‍යන්තර විගණක ප්‍රකාශ කරන ලදි. නියමිත දිනට බැංකු සැසඳුම් ඉදිරිපත් කරන ලෙස මාසිකව යැවිය යුතු අනෙකුත් වාර්තා වන ධාවන සටහන් පොත් විගණන අධිකාරි කාර්යාලය වෙතත්, මාසික ගිණුම් සාරාංශ, ආදායම් වාර්තාව, තැන්පත් වාර්තා, ප්‍රේෂණ වාර්තා ප්‍රධාන කාර්යාලය වෙත නියමිත දිනට ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙසත්. නියමිත දිනයන්ට මාසිකව යැවිය යුතු වාර්තා ඉදිරිපත් නොකිරීමෙන් ඉංජිනේරු කාර්යංශයේ කීර්ති නාමයටද හානිවන බැවින් මේ සම්බන්ධයෙන් වැඩි අවධානය යොමු කරන ලෙසත් නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ව දැනුවත් කරන ලදි.</td><td>ප්‍රධාන ගණකාධිකාරි / ගණකාධිකාරි සියළු ප්‍රාදේශීය ඉංජිනේරුවරු</td></tr>
<tr><td>02</td><td>අත්තිකාරම් 'බී' ගිණුමට අදාලව ණය අය නොවීම.</td><td>ණය ශේෂ නිරවුල් නොකර ඇති ආයතන වෙත පළාත් පාලන කොමසාරිස්ගේ අංක:LGD/01/F/2023/03 හා 2023.11.27 දිනැති ලිපියට අනුව 2024.03.15 දිනට පෙර ණයශේෂ නිරවුල් කර ගැනීමට අවශ්‍ය කටයුතු කරන ලෙස දන්වන ලදි.<br>නොපියවා ඇති 2024.02.28 දිනට ණය අයවීම් පිළිබඳ වාර්තාව
<table>
<tr><th>අනු අංකය</th><th>නිලධාරිගේ නම</th><th>තනතුර</th><th>ස්ථාන මාරුවී ගිය දිනය</th><th>2024.02.28 දිනට අයවීමට ඇත ණය ශේෂය රු.</th></tr>
<tr><td></td><td colspan="4">පළාත් පාලන ආයතන වලට ස්ථාන මාරුවී ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂයන්</td></tr>
<tr><td>1</td><td>ජී.එස්.අමරසිංහ</td><td>කළ.සේවා. සහකාර</td><td>2016.01.16</td><td>809.00<br>මෙම ණය ශේෂය කඩිනමින් පියවීමට කටයුතු කරන ලෙස දන්වන ලදි</td></tr>
<tr><td>2</td><td>පී.ජේ.එස්.පෙරේරා</td><td>කළමනාකරණ සහකාර</td><td>2018.02.28</td><td>ණය ශේෂය පියවා අවසන්</td></tr>
<tr><td>3</td><td>එස්.එම්.වඩුගේ</td><td>කළමනාකරණ සහකාර</td><td>2018.11.05</td><td>ණය ශේෂය පියවා අවසන්</td></tr>
<tr><td>4</td><td>සී.කේ.තන්තුලගේ</td><td>රියදුරු</td><td>2019.06.03</td><td>81,261.00<br>2024.03.15 දිනට පෙර ණය ශේෂය පියවීමට කටයුතු කරන ලෙස ගම්පහ මහ නගර සභාවේ නාගරික කොමසාරිස් වෙත දන්වා ඇත.</td></tr>
<tr><td>5</td><td>ඩබ්.ඒ.ටී.එස්. වනිගසුන්දර</td><td>කළමනාකරණ සහකාර</td><td>2020.01.01</td><td>120,135.00<br>2024.03.15 දිනට පෙර ණය ශේෂය පියවීමට කටයුතු කරන ලෙස ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාවේ නාගරික කොමසාරිස් වෙත දන්වා ඇත.</td></tr>
</table></td><td>ප්‍රධාන ගණකාධිකාරි / ගණකාධිකාරි</td></tr>
</table>

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | 6 | ඩබ්.සී.එස්.පෙරේරා | කළමනාකරණ සහකාර | 2020.01.17 | 2,500.00 | |
| | | 7 | ඒ.එස්.ඒ.සිල්වා | තාක්ෂණ නිළධාරි | 2022.03.31 | 96,515.00<br>මෙ වන විට ණය පියවීමට අදාල චෙක්පත ලැබී ඇත. | |
| | | 8 | අයි.පී.ආර්.පෙරේරා | කළමනාකරණ සහකාර | 2020.02 17 | 116,218.00<br>ණය ශේෂය නිරවුල් කළද චෙක්පතේ ආදායකයාගේ නම නිවැ දි කර එවන ලෙස දන්වා යවන ලදි. | |
| | | 9 | එන්.පී.ඩබ්. ජයවර්ධන | සංවර්ධන නිලධාරි | 2021.12.15 | ණය ශේෂය පියවා අවසන් | |
| | | 10 | පී.ජී.එල්.ආලෝකා | තාක්ෂණ නිළධාරි | 2020.02.10 | 119,264.00 2024.03.15 දිනට පෙර ණය ශේෂය පියවීමට කටයුතු කරන ලෙස මොරටුව මහ නගර සභාවේ නාගරික කොමසාරිස් වෙත දන්වා ඇත. | |
| | | 11 | එස්.යූ.විමලසිරි | කළමනාකරණ සහකාර | 2023.01.01 | 115,000.00<br>2024.03.15 දිනට පෙර ණය ශේෂය පියවීමට කටයුතු කරන ලෙස ගම්පහ මහ නගර සභාවේ නාගරික කොමසාරිස් වෙත දන්වා ඇත. | |
| | | 12 | *ආර්.පී.එස්.විදුරංග* | කළමනාකරණ සේවා නිලධාරි | 2023.07.17 | 214,961.00<br>2024.03.15 දිනට පෙර ණය ශේෂය පියවීමට කටයුතු කරන ලෙස කොළඹ කැම්බල් උද්‍යානයේ දිසා කාර්යාලයේ පරිපාලන නිලධාරි (වැ.බ.) වෙත දන්වා ඇත. | |
| | | | | | | **866,663.00** | |
| | | | රජයට /වෙනත් පළාත් සභාවකට /පළාත් සභාවේ වෙනත් කාර්යාලයකට ස්ථානමාරුවී ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂ - විදේශදූත සේවය සඳ ාා | | | | |
| | | 13 | එම්.එච්.ගුණසේ කර | කළමානකාරණ සේවා නිලධාරි | 2020.02.07 | 102,000.00 | |
| | | | | 2023.12.31 දක්වා වූ ණය වාරික නිරවුල් කර ඇත. කාර්තු වශයෙන් ණයවාරික නිරවුල් කරනු ලබයි. | | | |
| | | | සේවය හැර ගොස් ඇති නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂ | | | | |
| | | 14 | ආර්.ඒ.එම්.එම්.ර ණසිංහ | තාක්ෂණ නිලධාරි | 2013.01.15 | 119,689.00 | |
| | | | | කඩුවෙල සමථමණ්ඩලයට යොමු කර 2024.01.27 හා 2024.02.24 දෙදිනම මෙම නිලධාරියාව කැඳවූවද එම දින දෙකෙදිම සමථමණ්ඩලය වෙත පැමිණ නොමැත. ඒ අනුව සමථමණ්ඩලය විසින් 1988 අංක 72දරන සමථ මණ්ඩල පනත අනුව සමථ කිරිමෙන් ආරවුල හෝ වරද නිරවුල් නොකිරීමේ සහතිකයක් ලබා දි ඇති අතර එම සහතිකය නිති නිලධාරි වෙත අංක:CSWP/ENG-ADM/26-8/FI/1 හා 2024.02.29 දිනැති ලිපියෙන් යොමු කර ඇත. | | | |
| 03 | කල් ඉකුත්වූ තැන්පතු | 2023.12.31 දිනට වසර 02 ඉක්මවු තැන්පතු නොමැත<br>ඉදිරියේදි සියළුම ඉදිකිරිම කොන්ත්‍රාත්තු වල රැඳවුම්, වසර 02 ඉක්මවිමට පෙර නිරවුල් කරීමටත්, වසර 02 ඉක්මවන්නේ නම් රජයේ ආදායමට බැර කිරීමටත්, අවශ්‍ය අවස්ථා වලදී ආදායමෙන් ආපසු ගෙන නිරවුල් කිරීමටත්, කටයුතු කරන ලෙසත් නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් ප්‍රාදේශීය ඉංජිනේරුවරුවන්ව දැනුවත් කරන ලදි. | | | | | නි.ප්‍ර.ලේකම් (ඉංජිනේරු)<br>ප්‍රධාන ගණකාධිකාරි / ගණකාධිකාරි /<br>සියලුම ප්‍රාදේශීය ඉංජිනේරු |

| | | | |
|---|---|---|---|
| 04 | මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය පිහිටි (නව සහ පැරණි) භූමිය බස්නාහිර. පළාත් සභාවට පවරා ගැනීම | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු ) සහ ප්‍රාදේශීය ඉංජිනේරු (මීගමුව) සමඟ 2024.02.29 දින මීගමුව නව සහ පැරණි ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයන් පිහිටි භූමියන් බස්නාහිර පළාත් සභාවට පවරා ගැනීම සම්බන්ධයෙන් සාකච්ඡාවක් පවත්වන ලද අතර, එහිදී පහත කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලදී.<br><br>■ මේ වන විට මීගමුව ප්‍රාදේශීය ලේකම් හා ගම්පහ මිනින්දෝරු අධිකාරී විසින් හුවමාරු කර ගෙන ඇති ලිපි ලේඛනයන් කෙරෙහි අවධානය යොමු කරන ලදී.<br><br>■ එහිදී පැරණි සහ නව කාර්යාලය පිහිටි භූමිය රජයේ ඉඩම් ආඥා පනත යටතේ පළාත් සභාව වෙත පවරා දීම සඳහා මූලික පිඹුරක් සකස් කළ යුතු බවට මීගමුව ප්‍රාදේශීය ලේකම් විසින් ගම්පහ මිනින්දෝරු අධිකාරී වෙත දැනුම් දී ඇති බවට නිරීක්ෂණය විය.<br><br>■ ගම්පහ මිනින්දෝරු අධිකාරී විසින් පැරණි සහ නව කාර්යාල ගොඩනැගිලි පිහිටි ඉඩම් සඳහා මැනුම් ගාස්තු රු.42,480.00ක් බැගින් වැය වන බවට මීගමුව ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා ඇත.<br><br>■ මේ පිළිබඳව මීගමුව ප්‍රාදේශීය ලේකම් හා ගම්පහ මිනින්දෝරු අධිකාරී සමඟ දුරකථනයෙන් සම්බන්ධ කර ගෙන විමසීම් කරන ලදී.<br><br>■ මෙම ක්‍රියාවලිය කඩිනම් කර ගැනීම සඳහා ප්‍රාදේශීය ඉංජිනේරු (මීගමුව) විසින් මීගමුව ප්‍රාදේශීය ලේකම් හා ගම්පහ මිනින්දෝරු අධිකාරී යන නිලධාරීන් දෙදෙනා 2024.02.29 දින අදාළ ලිපි ලේඛනයන් ද සමඟ හමු වී සාකච්ඡා කරන ලදී.<br><br>මැණුම්ගාස්තු සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රධාන කාර්යාලයෙන් ලබාගෙන කඩිනමින් මැණුම් කටයුතු සිදු කර ඉදිරි කටයුතු සිදු කරන ලෙස මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරුවෙත උපදෙස් ලබා දෙන ලදි.<br><br>මීගමුව පැරණි ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල ගොඩනැගිල්ල, මාර්ග සංවර්ධන අධිකාරියෙන් ඉල්ලා ඇති බැවින් එම ඉල්ලීම ප්‍රධාන ලේකම් බ.ප. වෙත යොමු කර ඇත. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) / පරිපාලන නිලධාරි/ මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු |
| | අවිස්සාවේල්ල ඉඩම | 2. 2023.11.22 දින ප්‍රධාන ලේකම් (බ.ප.)ගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමේදි ගත් තිරණ පරිදි ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ සබරගමුව ප්‍රාදේශීය කාර්යාලය ඉදිරියට මාස 06 ක් පවත්වාගෙන යාමට අනුමැතිය ලබාදෙන ලද අතර,<br><br>2023 ජුනි මස සිට දෙසැම්බර් මස දක්වා මාසිකව රු.20,000/- බැගින් වූ හිඟ බදු මුදල් 2023.12.31 ට පෙර ගෙවා අවසන් කර ඇත.<br><br>2024 ජනවාරි හා පෙබරවාරි මාස සඳහා මාසික කුළිය රු.20,000/- බැගින් ගෙවීම් කර ඇත.<br>ඉදිරියට ලබාදුන් මාස 06 ක කාලය අවසන් වූ පසු මෙම ඉඩම හා ගොඩනැගිල්ල වෙනත් රාජ්‍ය ආයතනයකට ලබාදිමට කටයුතු කරන ලෙස නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරු වෙත දන්වන ලද අතර පසුව මෙම භූමිය සෞඛ්‍ය අමාත්‍යාංශයට පැවරිම සුදුසුබව යෝජනා විය. ඒ අනුව මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරන ලෙස හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරුට උපදෙස් ලබා දෙන ලදි. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) / පරිපාලන නිලධාරි/ හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරු |

| | | | |
|---|---|---|---|
| 05 | ලිපිගොනු කළමනාකරණ ක්‍රියාවලිය සම්බන්ධ මෘදුකාංග පද්ධතිය (DMS) | මෙම ලිපිගොනු කළමනාකරණ ක්‍රියාවලිය සම්බන්ධ මෘදුකාංග පද්ධතිය (DMS) ප්‍රධාන කාර්යාලයේ හා ප්‍රාදේශීය කාර්යාලවල මේ වනවිට ක්‍රියාත්මක වන අතර, Process Automation ක්‍රියාවලීන්වල තැපැල හැරුණු විට අනෙකුත් ක්‍රියාවලීන් ද නිම කර ඇත.<br><br>නමුත් මේ වන විට User Account ලබාදී තිබුණද සියලු කාර්යමණ්ඩලය සඳහා පුහුණුව ලබාදීම හා අප විසින් ඉල්ලුම් කරනු ලබන අඩුපාඩු සකසා දීම ප්‍රමාද වන බැවින් මේ පිළිබඳව දන්වා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)ගේ අංක CSWP/ENG-ADM/55-1/FI/01/(A) හා 2024.03.04 දිනැති ලිපිය මගින් ගෙවීම් අත්හිටුවන ලෙස දන්වා අධ්‍යක්ෂ, තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය (බ.ප.) වෙත ලිපියක් ඉදිරිපත් කරන ලදි. (ඇමුණුම 01)<br><br>මෙම පුහුණුව ප්‍රමාණවත් පරිදි සියලු කාර්යමණ්ඩලය වෙත ලබා දෙමින් සියල්ලන් විසින් ආරම්භ නොකරන්නේ නම් මෙම Process Automation System යොදාගෙන රාජකාරී කටයුතු කිරීම ගැටළුකාරී වන බවද පෙන්වා දෙමි.<br><br>Process Automation ක්‍රියාවලිය කරගෙන යාමේදි ගැටළු රාශියක් ඇතිවූ බැවින්, අවස්ථා කිහිපයකදිම මේ සම්බන්ධයෙන් අදාල ආයතනය දැන්වත් කළද මෙතෙක් එම ගැටළු නිරාකරණය කර නොමැති බවද අධ්‍යක්ෂ ඉංජිනේරු පැහැදිලි කරන ලදි<br><br>Process Automation ක්‍රියාවලියේ ඇති අඩුපාඩු සම්බන්ධයෙන් අදාල ආයතනය දැනුවත් කර ඔවුන් එම අඩුපාඩු නිවැරදි කිරිම මෙම කාර්යාංශයට ආදාල පරිදි සිදු නොවන්නේ නම් ඒ සම්බන්ධයෙන් ගිවිසුම ප්‍රකාරව ඉදිරි කටයුතු සිදු කිරීමට තීරණය විය. | නි.ප්‍ර.ලේ. ඉංජිනේරු/ අධ්‍යක්ෂ ඉංජිනේරු / ගොඩනැගිලි අධ්‍යක්ෂ |
| 06 | වාහන පරිපාලනය සම්බන්ධව | ඉන්ධන දහන පරීක්ෂාව ප්‍රධාන කාර්යාලයේ හා සියළුම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවල සිදු කර අවසන් කර ඇත.<br><br>2024 වර්ෂයේ සිට ධාවන සටහන් පොත් බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ 6 වන මහලේ ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති කාර්යාලය වෙත යොමු කරන ලෙස සියළුම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල වෙත අංක:CSWP/ENG-ADM/29-10/FI/1 හා 2024.01.24 දිනැති ලිපියෙන් දන්වා ඇත. | සියළු ප්‍රාදේශීය ඉංජිනේරුවරු/ පරිපාලන නිලධාරි |
| 08 | මාසික ගිණුම් සාරාංශය ඉදිරිපත් කිරිම හා අග්‍රිම ඉල්ලිම | 2023 IV වන කාර්තු විගණන කළමනකරණ කමිටු රැස්වීමේදි ලබා දුන් උපදෙස් බොහෝමයක් ප්‍රාදේශීය කාර්යාල සිදුකලද සමහර කාර්යාල තවමත් පෙර පරදිම අඩුපාඩු සහිතව ගිණුම් සාරාංශ ඉදිරිපත් කරන බව නිරීක්ෂණය විය<br><br>සමස්තයක් වශයෙන් ගත්විට මෙම මාසයේ ගිණුම් සාරාංශය නිවැරදිව ඉදිරිපත් කරන කාර්යාල ඊලඟ මාසයේදි අඩුපාඩු ඇතිව ඉදිරිපත් කරනු ලබන අවස්ථා පවතින බවත්, මතුගම හා හොරණ කාර්යාල අඩුපාඩු රහිතව ගිණුම් සාරාංශ ඉදිරිපත් කරන බවත් ගණකාධිකාරි ප්‍රකාශ කරන ලදි.<br><br>මාසික ගිණුම් සාරාංශ ප්‍රධාන කාර්යාලයට එවිමට පෙර මාසික ගිණුම් සාරාංශය සමඟ මාසයට අදාලව ගිණුම් ගත කල වත්කම් තොරතුරු | ප්‍රධාන ගණකාධිකාරී / ගණකාධිකාරී / සියලුම ප්‍රාදේශීය ඉංජිනේරු |

| | | | |
|---|---|---|---|
| | | නිවැරදිද යන්න, වැය විෂය අනුව කල වියදම්, පොදු තැන්පතු ලේඛනයේ ලැබීම් හා ගෙවීම්, ණය අත්තිකාරම් ගෙවීම් හා අයවීම්, මාසික ප්‍රේෂණ අදාල අදායම් ශීර්ෂ අනුව සටහන්ව ඇත්ද යන්න, ප්‍රධාන කාර්යාලයෙන් ලබාදී ඇති අග්‍රිම නිවැරදිව නියමිත මුදලම පොත්වලට ගෙන ඇතිද යන්න පරීක්ෂාකර ඉදිරිපත් කිරිමට කටයුතු කරන ලෙසත්, ගිණුම් සාරාංශයේ යම් වරදක් නැවත සකස් කල විට වරද නිවැරදි කළ කොටස පමණක් මුද්‍රණය නොකර සම්පූර්ණ ගිණුම් සාරාංශයම මුද්‍රණය කර ප්‍රධාන කාර්යාලයට එවීමට කටයුතු කරන ලෙසද ගණකාධිකාරි පැහැදිලි කරන ලදි. තවද මාසය අවසන්වන තෙක් ගිණුම් සාරාංශ සැකසීමට නොසිට එදිනෙදා අදාල තොරතුරු සිගාස් වැඩ සටහනට අතුලත් කිරිමට කටයුතු කරන ලෙසද පැහැදිලි කරන ලදි.<br><br>ප්‍රධාන කාර්යාලයෙන් නිකුත් කරනු ලබන අග්‍රිම සමහර ප්‍රාදේශීය කාර්යාල මුදල් පොතට ගෙන නොතිබූ අවස්ථා නිරීක්ෂණය වූ බැවින් මාසය අවසන් වීමට පෙර මාසයට අදාලව තම කාර්යාලයන්ට ලබාදී ඇති අග්‍රිම ප්රධාන කාර්යාලයෙන් තහවුරු කරගන්නා ලෙසත් නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් ප්‍රාදේශීය ඉංජිනේරුවරුවන්ව දැනුවත් කරන ලදි.<br><br>ස්ථාවර වත්කම් ලේඛණය 2023.12.31 දිනට යාවත්කාලින කර ඒ පිළිබඳ තහවුරුවක් 2024.02.15 දිනට පෙර ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලෙස සියළු ප්‍රාදේශීය ඉංජිනේරුවරු දැනුවත් කලද ඉදිරිපත් කර අත්තේ ගම්පහ, වත්තල හා මිනුවන්ගොඩ කාර්යාල පමණක් බවත්, වසර දෙක ඉක්මවූ තැන්පත් ආදායමට ගැනිමට කටයුතු කරන ලෙසත්, මාස 06 ඉක්තු වූ චෙක්පත් තබා නොගන්නා ලෙසත්, PSSP හා GEMP වාර්තා මාසික ගිණුම් සාරාංශය සමඟ පරික්ෂා කර ඊළඟ මාසයේ මුල් දින 02 තුල ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කරන ලෙසත්, ප්‍රතිපාදන සීමාව ඉක්මවා වියදම් නොකරන ලෙසත්, වැට් ලියාපදිංචිව සිටියද වැට් නිශ්කාශන සහතිකය නොමැතිව වැට් නොගෙවන ලෙසත්, වැය ලේජර්, තැන්පත් ලේඛනය මුදල්පොත් සමඟ පරීක්ෂා කර මාසික ගිණුම් සාරාංශයේ සෑම උපලේඛනයක්ම ගණකාධිකාරිගේ අත්සනින් යුතුව ඉදිරිපත් කර ලෙසත්, මතුගම හා කළුතර කාර්යාලවලින් භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොමැති බවත්, ප්‍රධාන ගණකාධිකාරි ප්‍රකාශ කරන ලදි. | |

2 ) ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපතිගේ හා විගණන අධිකාරිගේ අදහස් හා පැහැදිලි කිරිම්

| | මතුකළ කරුණු |
|---|---|
| 1 | මීගමුව කණිෂ්ඨ විද්‍යාලයේ ජල අවශ්‍යතාවය සඳහා රු.700,000.00 ක පමණ මුදලක් වැය කර නළ ළිඳක් ඉදිකිරිම සම්බන්ධයෙන් පරික්ෂකර බලන ලෙසත්, |
| 2 | පිඹුර මුලික රෝහලේ ගිලන්රථ ගරාජය අළුත්වැඩියා ඉදිකිරිම්හිදී අඩුපාඩු හා ප්‍රමාදයන් සිදුව ඇති බවත්, |
| 3 | පාසැල්වල ඉදිකිරිම් වැඩ සඳහා ප්‍රමුඛතාවය ලබාදිම සිසුන්ගේ ආරක්ෂාව වඩා සුදුසුබව |
| 4 | 2022 හා 2023 වර්ෂවලදී ඉංජිනේරු හා තාක්ෂණ නිලධාරීන් සඳහා ගෙවූ වැටුප් විස්තරයක් ලබා දෙන ලෙස ද ඉල්ලීමක් කරන ලදි. |

## (3) අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණනකගේ අදහස් හා පැහැදිලි කිරීම

| | මතුකළ කරුණු |
|---|---|
| 1 | හෝමාගම පශු වෛද්‍ය කාර්යාලයේ අඩුපාඩු සඳහා රු.350,000 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත්වී තිබූ බව |
| 2. | ගම්පහ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ ගමන් වියදම් ගෙවීමේදී ප්‍රමාද ගාස්තු අයකර නොතිබූ බව |
| 3. | මිගමුව නිව්ස්ලන්ඩ් බාලිකා විද්‍යාලයේ 2018 වර්ෂයේදී ආරම්භ කරන ලද ඉදිකිරීමක් තවම අවසන්ව නොමැති බව |
| 4. | කළුතර පානදුර උපාධ්‍යා විද්‍යාලයේ පැරණි ගොඩනැගිල්ලක් කඩා ඉවත් කිරීම සම්බන්ධව |

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පවත්වා අදාල කරුණු සාකච්ඡා කිරීම ඉතා වැදගත් බවත්, එම කරුණු සම්බන්ධයෙන් විගණනයෙන් ලබාදෙන ලද වටිනා අදහස් රාජකාරි කටයුතු වලදී ඉතා ප්‍රයෝජනවත් බවත්, ඔබගේ වටිනා කාලය වැයකර මෙම රැස්වීම සඳහා සහභාගි වීම සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති, විගණන අධිකාරි, අධ්‍යක්ෂ - අභ්‍යන්තර විගණක, සියළුම ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ට හා අනෙකුත් සහභාගි වූ සියළු නිලධාරින්ට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) ස්තුතිය එල කිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු පස්වරු 4.05 ට පමණ අවසන් කරන ලදි.

ඉංජි. කේ.ආර්.අබේසිරිවර්ධන
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු),
පළාත් ඉංජිනේරු කාර්යාංශය,
බස්නාහිර පළාත.

ඉංජි. කේ.ආර්. අබේසිරිවර්ධන
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)
ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
පස්වන මහල, අංක 204,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත
බත්තරමුල්ල

දුරකථන අංකය : 0112092524
ෆැක්ස් අංකය : 0112092523
විද්‍යුත් ලිපිනය : eng.org.acc@gmail.com